ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2296/36 – 2022 සැප්තැම්බර් 09 වැනි සිකුරාදා – 2022.09.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව**

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත**

27(අ)(1) වැනි වගන්තිය යටතේ නියමය

1975 අංක 39, 1981 අංක 14. 1981 අංක 39. 1986 අංක 18 දරන පනත්වලින් සංශෝධිත 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සංචාරක හා ඉඩම් අමාත්‍ය, හරින් ප්‍රනාන්දු වන මම, ඉහත කී පනතේ විධි විධාන යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති මෙහි පහත උපලේඛනවල සඳහන් කෘෂිකාර්මික ඉඩම් කොටස් එකී ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1) ආ ආ වගන්තිය ප්‍රකාරව 2008 අංක 36 දරන පනත මගින් පිහිටුවා ඇති නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත විකිණීමෙන් පවරා දෙනු ලැබේ.

1) ඉහත කී විකිණීම සඳහා මුදල් ප්‍රතිෂ්ඨාව වශයෙන් රුපියල් 60,000,000/- ක (රුපියල් මිලියන හැටක්) මුදලකට එකී නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත පහත උපලේඛන ගත ඉඩම් මෙම නියමය මගින් සතුකර පවරා දෙමි.

| උපලේඛන | ඉඩමේ නම | පිඹුරු අංකය | කැබලි අංකය | ප්‍රමාණය අක්කර | රූඩ් | පර්චස් |
|---|---|---|---|---|---|---|
| අංක. 01 | ඕර්චඩ් වත්ත | 1544 | 01 | 01 | 2 | 00 |
| අංක. 02 | ඕර්චඩ් වත්ත | 1544 | 02 | 07 | 2 | 20.2 |

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2022 අගෝස්තු මස 22 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය(ඉඩම්)
''මිහිකත මැදුර'',
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1 වන උපලේඛනය - ඕර්වඩ් වත්ත

ඉඩමේ විස්තරය : බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඕර්වඩ් වත්ත නමැති ඉඩම විශේෂ්‍ය අංක කො/3179 යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇත. මෙම ඉඩමට අදාළව බලයලත් මිනින්දෝරු කේ.ඩබ්.එස්.කේ. වික්‍රමරාජා මහතා විසින් 2021.05.12 දිනැතිව මැන සකස් කරන ලද අංක 1544 දරන පිඹුරෙහි පහත සඳහන් කැබැලි අංක සහ ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්ව,

කැබලි අංක 01

| | | |
|---|---|---|
| ප්‍රමාණය | : | අක්කර 01 රූඩ් 2 පර්චස් 00 (හෙක්ටයාර් 0.6070) |
| උතුරට | : | මෙම ඉඩමේ කැබලි අංක 2 |
| නැගෙනහිරට | : | පාර (ප්‍රාදේශීය සභා) |
| දකුණට | : | මෙම ඉඩමේ කැබලි අංක 2 |
| බටහිර | : | කැබලි අංක 2 |

2 වන උපලේඛනය - ඕර්වඩ් වත්ත

ඉඩමේ විස්තරය : බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඕර්වඩ් වත්ත නමැති ඉඩම විශේෂ්‍ය අංක කො/3179 යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇත. මෙම ඉඩමට අදාළව බලයලත් මිනින්දෝරු කේ.ඩබ්.එස්.කේ. වික්‍රමරාජා මහතා විසින් 2021.05.12 දිනැතිව මැන සකස් කරන ලද අංක 1544 දරන පිඹුරෙහි පහත සඳහන් කැබැලි අංක සහ ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්ව,

කැබලි අංක 02

| | | |
|---|---|---|
| ප්‍රමාණය | : | අක්කර 07 රූඩ් 2 පර්චස් 20.2 (හෙක්ටයාර් 3.0862) |
| උතුරට | : | මූලික පිඹුරු අංක කො/1870 හි කැබලි අංක 01 |
| නැගෙනහිරට | : | ප්‍රාදේශීය සභා මාර්ගය සහ මෙම පිඹුරෙහි කැබලි අංක 01 |
| දකුණට | : | මෙම පිඹුරේ කැබලි අංක 01 සහ කැබලි අංක 02 |
| බටහිර | : | මූලික පිඹුරු අංක කො/1870 හි කැබලි අංක 2 |

EOG 09 – 0079

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.